සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# Provincial Department of Education - NWP

40 S I

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ............................................ පෙරදිග සංගීතය - I කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (5) ලකුණ යොදන්න.

---

01. ස්වර ගායනය එකවර සිදු කිරීමට අපහසු ආධුනිකයෙකුට භාවිත කළ හැකි ගීත විශේෂය වනුයේ,

(1) භජන් ගී (2) මධ්‍යලය ගී (3) ස්වර ස්ථාපන ගී (4) ලක්ෂණ ගී

02. 5 5 5 / 5 5 5 / 5 5 5 / 5 5 5

ඉහත රිද්ම රටාවට ගැයෙන ගීතයකි.

(1) දියගොඩ සැමතැන (2) මොනවද මුත්තේ

(3) වඳිමු සුගත (4) මිහිකත නලවාලා

03. අවග්‍රහයෙන් ඇරඹෙන ගීතයක් වනුයේ,

(1) හෙළ ජාතික අභිමානේ (2) ලංකා ලංකා

(3) ගලන ගඟකි ජීවිතේ (4) දන්නෝ බුදුන්ගේ

04. ග රි ස ප ම ග රි ස, නි රි ස ... මෙම ස්වර අයත් රාගය,

(1) කාෆි (2) බිලාවල් (3) යමන් (4) භෛරවී

05. පහත ඨේකාවේ දෙවන විභාගයට අයත් අක්ෂර වනුයේ,

ධි නා / / ති නා / ධි ධි නා

(1) ධි නා නා (2) ධි ධි නා (3) ති ති නා (4) ති නා

06. සර්ව කෝමළ රාගයකි.

(1) යමන් (2) කාෆි (3) භූපාලි (4) භෛරවී

07. සංගීතයේ දී ලය ප්‍රධාන කොටස් කීය ද?

(1) 2යි (2) 4යි (3) 3යි (4) 5යි

08. ''බැතිනා සිරිපා කරුණා කරනා'' ඉහත ගී පාදයේ ලඝු ගුරු අක්ෂරයන්ගේ එකතුව වන්නේ,

(1) 12කි (2) 10කි (3) 16කි (4) 15කි

09. සිතාරයේ ප්‍රධාන තත් සංඛ්‍යාව,

(1) 5කි (2) 4කි (3) 7කි (4) 6කි

10. ප්‍රසිද්ධ දක්ෂ එස්රාජ් වාදකයෙකි,

(1) අමීර් කුෂ්රු (2) පණ්ඩිත් රවිශංකර් (3) උස්තාද් විලයාත් ඛාන් (4) පණ්ඩිත් නිකිල් බැනර්ජි

11. රාගයක යෙදෙන ස්වර අතුරින් වාදී සංවාදී ස්වර හැරුණු විට ඉතිරි ස්වර හඳුන්වන්නේ,

(1) විවාදි ස්වර ලෙස (2) වර්ජ ස්වර ලෙස

(3) අනුවාදී ස්වර ලෙස (4) මුඛ්‍යාංගය ලෙස

12. විදුලි ඕගනයක ලය නැතහොත් වේගය සකසා ගැනීමට භාවිතා කළ යුතු ස්විචය හඳුන්වන්නේ,

(1) Tone (2) Tracks (3) Tempo (4) Beat

13. බොක්ස් ගිටාරයක විවෘත තත් පිළිවෙළින් නම් කිරීමේ දී

(1) E A D G B E (2) E A G D B E (3) D A E G B E (4) A B C D E F

14. F මේජර් කෝඩ් එකට අයත් ස්වර වන්නේ,

(1) D, F, A (2) F, A, C (3) G, B, D (4) C, E, G

15. සිංහල කණ්ඩායම් ගීයේ නිර්මාතෘවරයා වන්නේ,

(1) ක්ලැරන්ස් විජේවර්ධන මහතා (2) බ්‍රයන් රණසිංහ මහතා

(3) නෙවිල් ප්‍රනාන්දු මහතා (4) සී. ටී. ප්‍රනාන්දු මහතා


16. /ස ස රි රි / ග ග මධ / ප /

මෙම ගී පාදයට අයත් හිංදුස්ථානී සහ බටහිර තාලය වන්නේ,

(1) ජප් 5/8 (2) දීප් චන්දි 7/8 (3) ඛෙම්ටෝ 6/8 (4) ලාවනී 2/4

17. අපරදිග තූර්ය වාදක භාණ්ඩ ප්‍රධාන වශයෙන් කොටස් කීයකට බෙදේ ද?

(1) 4යි (2) 2යි (3) 5යි (4) 3යි




ඉහත බටහිර ප්‍රස්තාරය ඇසුරින් 18 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

18. මෙහි තාල සංකේතය හෙවත් (Time Signature) වන්නේ,

(1) 3/4 (2) 4/4 (3) 2/4 (4) 6/8

19. "A" සංකේතයෙන් දක්වා ඇත්තේ

(1) සෙමිබ්‍රිව් රෙස්ට් (2) ක්‍රොචට් රෙස්ට් (3) ක්වේවර් රෙස්ට් (4) මිනිම් රෙස්ට්

20. "B" සංකේතයෙන් දක්වා ඇති සංකේතය වන්නේ,

(1) සෙමිබ්‍රිව් (2) ක්‍රොචට් (3) මිනිම් (4) ක්වේවර්

21. "F" මේජර් ස්කේලයට අදාල ස්වර වන්නේ,

(1) ම ප ධ නි ස් රි ග් ම් (2) ම ප ධ නි ස් රි ග් ම්

(3) ම ප ධ නි ස් රි ග් ම් (4) ම ප ධ නි ස් රි ග් ම්

22. ''දැතට වළලූ...'' ගීතයට පාදක වූ ජන ගී විශේෂය වන්නේ,

(1) ගොයම් ගී (2) නාඩගම් ගී (3) නෙළුම් ගී (4) වන්නම්

23. පහතරට වන්නම් සම්ප්‍රදායේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) දවුල (2) ගැටබෙරය (3) දෙවොල් බෙරය (4) තම්මැට්ටම

24. පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණය අනුව උඩැක්කිය අයත් වන්නේ,

(1) ආතත (2) සුෂිර (3) විතත (4) විතතාතත

25. යමන් රාගාශ්‍රිත සරල ගීයකි.

(1) ගුමුගුමුව වදුලේ (2) පාරමිතා බල (3) රුක් අත්තන මල (4) සාදු දන්තදා

26. හින්දුස්ථානී තාලයක් ආවර්ත දෙකක් වැයූ විට ලැබෙන මාත්‍රා ගණන 20කි. එම තාලය වන්නේ,

(1) ජප් තාලය (2) ත්‍රිතාලය (3) ධාදරා තාලය (4) දීප් චන්දි

27. නව නාට්‍ය ගීයකි.

(1) සුවඳ පත්ම (2) ලෝනා මුණි රාජගේ (3) ආලෙ බැන්ද (4) කුමටද සොබනියෙ

28. ''අම්මා වරුනේ ....'' ගීතය ගායනා කරනු ලබන්නේ,

(1) නීලා වික්‍රමසිංහ මහත්මිය (2) මාලනී බුලත්සිංහල මහත්මිය

(3) නන්දා මාලනී මහත්මිය (4) ලතා වල්පොළ මහත්මිය

29. තබ්ලා වාදනයක අංගයක් නොවන්නේ,

(1) කායදා (2) පල්ටා (3) ජලා (4) තිහායි

30. ''ඈසේ මධුර ජීවනයේ ගීතා ...'' මෙම ගීතය රචනා කරන ලද්දේ

(1) සුනිල් ශාන්ත මහතා (2) ආනන්ද සමරකෝන් මහතා

(3) ඩබ්ලිව්. ඩී. අමරදේව මහතා (4) සූර්ය ශංකර් මොල්ලිගොඩ මහතා

31. සරල ගීතයක බහුලව දක්නට ඇති ආකෘතිය පිළිවෙළින් සඳහන්ව ඇත්තේ,

(1) ස්ථායි අන්තරා පෙරවාදනය අතුරු වාදනය

(2) පෙරවාදනය ස්ථායි අතුරු වාදනය අන්තරා

(3) අන්තරා පෙරවාදනය ස්ථායි අතුරු වාදනය

(4) අතුරු වාදනය ස්ථායි අන්තරා පෙරවාදනය

32. කපිරිඤ්ඤා ගීත සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයක් නොවන්නේ,

(1) සරල තනු යෙදී තිබීම

(2) වේග රිද්ම ගායනය

(3) මුහුදු බඩ ප්‍රදේශවල ව්‍යාප්ත වීම

(4) ''මුළු ගතම වෙහෙසුනා ...ගීතය කපිරිඤ්ඤා ආශ්‍රිතව නිර්මිතය.

33. ''අටවිසිමත්'' පැදියකට අයත් වන්නේ,

(1) මනමත් කරවන (2) පැහැසරණිය මිණි පැමිණිය

(3) සඳවා සුදු වැලි (4) රෑ රැසේ අඳිනා ලෙසේ

34. අනාඝාතාත්මක ගැමි ගී විශේෂයකි.

(1) ගොයම් ගී (2) කමත් ගී (3) නෙළුම් ගී (4) පාරු ගී

35. බටහිර සංගීත ප්‍රස්තාරයක යෙදෙන "Repitation Mark" ගනයට අයත් නොවන සංකේතය කුමක් ද?

(1)  (2)  (3)  (4) 

36. මනමේ නව නාට්‍යයෙහි යෙදෙන ගීතයකි.

(1) ලෝ පසිඳු (2) දුල් නිමල් සේ දිසි (3) ඉර සඳ දෙවියනි (4) සත් වෙත සෙත් දෙන

37. ශ්‍රී ලංකාවේ ගුවන් විදුලිය ආරම්භ වූ වර්ෂය වන්නේ,

(1) 1918 (2) 1923 (3) 1825 (4) 1925

38. ඩබ්ලිව්. බී. මකුලොලුව මහතා අතින් නිර්මිත ''හෙළ ගී මඟ' කෘතියේ සඳහන් වන්නේ,

(1) මුද්‍රා නාට්‍ය පිළිබඳ තොරතුරු (2) රාගධාරී සංගීත තොරතුරු

(3) ජන සංගීත සිද්ධාන්ත හා ජන ගී (4) නර්තන සම්ප්‍රදායන් පිළිබඳ තොරතුරු

39. සී. ද. එස්. කුලතිලක මහතා විසින් නිර්මාණය කරන ලද කෘතියකි.

(1) 'අභිනව මූලික ගීත (2) ''බයිලා කපිරිඤ්ඤා විමර්ශණය

(3) ශ්‍රී ලංකාවේ සංගීතසම්භවය (4) 'උඩරට නර්තන කලාව'

40. වංග ගීත ශෛලිය නිර්මාණය කරන ලද්දේ

(1) අමීර් ඛුෂ්රු පඬිතුමා (2) පණ්ඩිත් රවිශංකර්

(3) රවින්ද්‍රනාත් තාගෝර් තුමා (4) හරි ප්‍රසාද් චෞරසියා

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

**Provincial Department of Education - NWP**

| 40 | S | |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

**නම/විභාග අංකය : ............................................... පෙරදිග සංගීතය - ප්‍රායෝගික පරීක්ෂණය**

ගුරු උපදෙස්:

- **පහත සඳහන් නිර්නායක පහ සඳහා සෑම අපේක්ෂකයෙකුම කේවලව ඇගයීමට ලක් කරන්න.**

---

01. ඔබ උගත් නිර්දේශිත රාග අතරින් භෛරවී හෝ යමන් රාගයට අදාළ ව පහත සඳහන් කොටස් ගායනය හෝ වාදනය කරන්න.
   - (i) ආරෝහණ, අවරෝහණ
   - (ii) මධ්‍යලය ගීතයේ ස්ථායි කොටස
   - (iii) මධ්‍යලය ගීතයේ අන්තරා කොටස
   - (iv) රාගයට අදාළ ස්වර සංගතියක් (ලකුණු 5 5 4 = 20යි)

02. (i) නිර්දේශිත ඔබ කැමති රාගයකට අදාලව පහත සඳහන් කොටස් අතරින් කැමති කොටසක් තෝරාගෙන ගායනය හෝ වාදනය කරන්න.
   - සර්ගම් / ලක්ෂණ ගී / ස්වර අභ්‍යාසයක් (ලකුණු 10)

   (ii) පහත සඳහන් තාල අතරින් ගුරුවරයා නම් කරන තාලයක් අතින් තාල දමා නිරූපණය කරන්න.
   දාදරා, ත්‍රිතාල්, කෙහෙර්වා, ඣප් තාලය, දීප් චන්දි, බෙම්ටෝ (ලකුණු 10)

03. පහත සඳහන් ගීත ඇසුරින් ඔබ කැමති ව්‍යවහාරික සංගීතාංග දෙකක් ගායනය/වාදනය කරන්න.
   - නව නාට්‍ය, ජන ගී ආශ්‍රිත සරල ගී, කැලිප්සෝ, නූර්ති, නාඩගම්, කෝලම් ගී, රාගාශ්‍රිත සරල ගී, මව්පිය ගුණ වරුණ ගී (ගීත 2කට ලකුණු 10 5 2 = 20 යි)

04. පහත සඳහන් ජන ගී වර්ග අතරින් ඔබ කැමති ''සේ ගීයක්'' හා ගැමි ගීයක් ගායනය හෝ වාදනය කර දක්වන්න.
   - ගොයම් ගී, නෙළුම් ගී, ප්‍රශස්ති, වන්නම්, කෙළි ගී, තුන් සරණේ ගී, රබන් ගී, දරු නැළවිලි

   (ගී වර්ග 2කට ලකුණු 10 5 2 = 20යි)

05. පහත සඳහන් ගී වර්ග අතරින් ඔබ කැමති ගී වර්ග 2ක් තෝරා ගෙන ස්වර වාද්‍ය භාණ්ඩයකින් හා ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් වාදනය කරන්න.

   වාදනය ප්‍රධානව ඉදිරිපත් කරන සිසුන් ස්වර වාද්‍ය භාණ්ඩයකින් ඉදිරිපත් කරන ගීතය ගායනය කරන්න.)

   මධ්‍යලය ගී, නූර්ති ගී, සරල ගී, නව නාට්‍ය ගී, ජන ගී ආශ්‍රිත සරල ගී, රාගාශ්‍රිත සරල ගී, ළමා ගී, උපදේශාත්මක ගී (ගී වර්ග 2 ගායනය/වාදනය සඳහා 10 5 2 = 20යි)

   මුළු ලකුණු 100)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 40 | S | II |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

**නම/විභාග අංකය :** ............................................ **පෙරදිග සංගීතය - II** **කාලය : පැය 02යි.**

**සැලකිය යුතුයි.**

(i) **පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04කට පිළිතුරක් සපයන්න.**

01. (i) එක් විකෘති ස්වරයක් පමණක් යෙදෙන ඔබට නිර්දේශිත රාගය නම් කරන්න.
(ii) 'රාත්‍රි දෙවන' ප්‍රහාරයේ ගැයෙන නිර්දේශිත රාගයකි. නම් කරන්න.
(iii) මගු, සරිස, ධු නි ස'' ස්වර සංගතිය අයත් නිර්දේශිත රාගය නම් කරන්න.
(iv) ස්වර වලින් පමණක් රචිත රාගධාරි ගීත විශේෂය කුමක් ද?
(v) තබ්ලා වාදනයකදී දෑතම යොදා ගනිමින් වාදනය කරන තබ්ලා අක්ෂරයක් නම් කරන්න.
(vi) තාලයක ප්‍රබල ම ස්ථානය හඳුන්වන්නේ කුමන නමකින් ද?
(vii) එස්රාජයේ ප්‍රධාන තත හඳුන්වන නම කුමක් ද?
(viii) ජප් තාලයට සමාන දේශීය තිත නම් කරන්න.
(ix) බටනලාවේ සියලුම සිදුරු වැසූ විට නිකුත් වන ස්වරය වන්නේ,
(x) [[ග රි ග රි | නි රි ස ]] මෙම සංකේතයෙන් අදහස් වන්නේ,
(xi) තානම සහිත සේ ගී විශේෂයකි. (1 x 12 = 12)
(xi) වයලින් පවුලේ විශාලම සාමාජිකයා නම් කරන්න.

02. A ස රි ග, ප ධ ප, ග රි ස
B නි රි ග, ම් ප ම් ප
C ධු නි ස රි, ග රි ස
(i) ඉහත A B C රාග තුන පිළිවෙළින් නම් කරන්න. (ල. 03)
(ii) ඉහත රාග තුනෙන් ඔබ කැමති රාගයකට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස තාල සංඥා සහිතව ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ල. 05)
(iii) A රාගයේ මේලය, ජාතිය, වාදී, සංවාදී ස්වර නම් කරන්න. (ල. 04)

03. (i) මාත්‍රා 16ක නිර්දේශිත හින්දුස්ථානි තාලය නියමිත තාල සංඥා සහිත ව ප්‍රස්තාර කරන්න. (ල. 04)
(ii) එයට සමාන දේශීය තිත නම්කර නියමිත තාල සංඥා සහිත ව ප්‍රස්තාර කරන්න. (ල. 04)
(iii) සෙවන සදනා සුවය ගෙනෙනා
රකිමු සැමදා දෙරණ නිතිනා
මෙම ගී පාද දෙක ගැළපෙන තාල රූපයකට අනුව පද ප්‍රස්තාර කරන්න. (ල. 04)

04. (i) හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය නම් කර, එහි දළ රූප සටහනක් ඇඳ කොටස් හතරක් නම් කරන්න. (ල. 05)
(ii) තබ්ලාවේ මුහුණත් දෙකෙහි දළ රූප රාමු ඇඳ පහත සඳහන් අක්ෂර උපදින ස්ථානය ලකුණු කර දක්වන්න. (න, නි, ගෙ, ක) (ල. 05)

(iii) භාරතයේ සුප්‍රසිද්ධ තබ්ලා වාදකයින් දෙදෙනෙක් නම් කරන්න. (ල. 02)

05.



(i) ඉහත දක්වා ඇති බටහිර ස්වර ප්‍රස්ථාරය පෙරදිග ක්‍රමයට ලියා දක්වන්න. (ල. 04)

(ii) එම ස්වර ප්‍රස්ථාරය මධ්‍යම භාවයෙන් ලියා දක්වන්න. (ල. 04)

(iii) Tie Mark

Rest Mark

Flat Mark

ඉහත මාතෘකා තුනෙන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 2 5 2 = 04)

06. (i) ජන ගී වර්ගීකරණය යටතේ ගැමි ගී වර්ග කර ඇති ප්‍රධාන කොටස් ගණන කීයද? එම කොටස් නම් කරන්න. (ල. 04)

(ii) පහත දක්වා ඇති ගැමි ගී එම වර්ග කිරීම යටතේ බෙදා වෙන්කර දක්වන්න.

l මලේ මලේ ඔය නාමල ...

l අතට වෙරළු ඇහිද ගෙනේ

l දඩිබිඩි ගගා කරනා වැඩ ...

l සීත ගඟුලෙදී ඇඳ පේවෙනවා...

l දොඩම් කපාලා ඇඹුල් තනාලා

l සම්මා සම්බුදු වෙන මුණු රජුනේ... (ල. 06)

(iii) සේ ගී වල ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

07. පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් තෝරා කෙටි සටහන් ලියන්න.

l ආනන්ද සමරකෝන් මහතා

l ඩබ්ලිව්. බී. මකුලොලුව මහතා

l සුනිල් ශාන්ත මහතා

l සී ද එස් කුලතිලක මහතා

එහිදී,

l ජීවන තොරතුරු

l සංගීත කලාව උදෙසා කරන ලද සේවාවන් පිළිබඳ විස්තර කරන්න. (ල. 3 5 4 = 12)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

40 S I - II

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

## පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (3) | 11. | (3) | 21. | (1) | 31. | (2) |
| 2. | (3) | 12. | (3) | 22. | (3) | 32. | (4) |
| 3. | (4) | 13. | (1) | 23. | (3) | 33. | (4) |
| 4. | (3) | 14. | (2) | 24. | (1) | 34. | (4) |
| 5. | (2) | 15. | (3) | 25. | (4) | 35. | (1) |
| 6. | (4) | 16. | (3) | 26. | (1) | 36. | (3) |
| 7. | (3) | 17. | (4) | 27. | (4) | 37. | (4) |
| 8. | (3) | 18. | (1) | 28. | (3) | 38. | (3) |
| 9. | (3) | 19. | (4) | 29. | (3) | 39. | (3) |
| 10. | (4) | 20. | (2) | 30. | (2) | 40. | (3) |

මුළු ලකුණු 40

### II කොටස

01. (i) යමන් රාගය (ii) කාෆි රාගය (iii) භෛරවී රාගය
(iv) සර්ගම් (v) ධා, ධිං (vi) සම්/සමග්‍රහය
(vii) 'බජ්කාතාර්' ලෙසිනි (viii) සුලු මැදුම් දෙතිත (ix) 'ප' ස්වරය
(x) මෙම ස්වර කොටස නැවත වරක් මුල සිට වාදනය කරන්න. (xi) වන්නම්
(xii) ඩබල් බේස් (ල. 1 5 12 = 12)

02. (i) A භූපාලි රාගය
B යමන් රාගය
C භෛරවී රාගය (ල. 03)
(ii) මධ්‍යලය ගීතයන් හෝ වාදිතයක් තාල සංඥා සහිතව ප්‍රස්තාර කිරීමට (ල. 05)
තාල සංඥා යොදා නොමැතිනම් (ල. 01) අඩුවේ.
(iii) නිවැරදිව ලියා ඇත්නම් (ල. 1 5 4 = 4)

03. (i) ත්‍රිතාලය (ල. 04)
(ii) මහතනි තිත (ල. 04)
(iii)

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සෙ | ව | න | ස | ඳ | නා | s | සු | ව | ය | ගෙ | නෙ | නා | s |
| ර | කි | මු | සා | ම | දා | s | දෙ | ර | ණ | නි | ති | නා | s |

(ල. 04)

04. (i) තබ්ලාව (ල. 01)
කොටස් 04නම් කිරීමට (ල. 04)
(ii) තබ්ලා මුහුණත් දෙකෙහි අක්ෂර ලකුණු කිරීමට
(1) මුහුණත් ඇඳීමට (ල. 01)
(2) ලකුණු කිරීමට (ල. 04) (ල. 05)
(iii) තබ්ලාවාදකයින් දෙදෙනෙක් නම්කර ඇත්නම් (ල. 02)

05. (i)| ග ම ප | ග රි ස | ස | ස | (ල. 04)
(ii)| ධ නි ස | ධ ප ම | ම | ම | (ල. 04)
(iii) එක් මාතෘකාවක් සඳහා (ල. 02)
මාතෘකා දෙකක් පැහැදිලි කිරීමට මුළු ලකුණු (ල. 04)

06. (i) 3යි (ල. 01)
(ii) । වෘත්තීන් මත ගොඩ නැගුණු ගී මෙහෙ ගී
। ඇදහිලි හා විශ්වාස මත ගොඩ නැගුණු ගී ඇදහිලි ගී
। විනෝදාස්වාදය හා සමාජ අවශ්‍යතා සමාජ ගී
(එක් වර්ගීකරණයක නමක් නම්කර තිබීම ප්‍රමාණවත්ය. (ල. 03)

**මෙහෙ ගී** මලේ මලේ..., දඩි බිඩි ගගා ...
**ඇදහිලි ගී** සීත ගඟුලෙදි ...., සම්මා සම්බුදු ...
**සමාජ ගී** අතට වෙරළු..., දොඩම් කපාලා ...
(ල. 1 5 6 = 6)
(iii) නිවැරදි කරුණු සඳහා (ල. 02)

07. කරුණු නිවැරදිව සඳහන් කර ඇත්නම් එක් මාතෘකාවකට ලකුණු 04 බැගින් ලබා දෙන්න.
(ල. 3 5 4 = 12)